නමෝ බුද්ධාය

විසි වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 204

ශ්‍රී. බු. ව. 2561 | 2017 ජුනි 08 | පොසොන් කළාපය

# කුසල විපාක

## අති පූජ්‍ය රිදියගම සුධමමාභිවංශ නාහිමිපාණන් විසිනි

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

සත්පුරුෂ පින්වතුනි, මෙහිදී බලාපොරොත්තු වන්නේ "කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති" යන ධර්ම පාඨය විස්තර කිරීමට වේ. ඒ අනුව

1) යහපත් කර්ම වලට ලැබෙන යහපත් විපාක ද

2) අයහපත් කර්ම වලට ලැබෙන අයහපත් විපාකද

පෙන්වනු ලැබේ. අප විසින් මුලදී යහපත් අයහපත් කර්ම මොනවා ද කියන බව පැහැදිලි කරන්නට යෙදුනි. දැන් අප ඒ ඒ කර්මයන් ගේ විපාක දක්වන්නෙමු. යහපත් කර්ම අතර මුලින්ම සඳහන් කළේ ත්‍රිවිධ පුණ්‍යක් ක්‍රියා කර්ම වේ. ත්‍රිවිධ පුණ්‍යක් ක්‍රියා ධර්ම නම් දාන, ශීල, භාවනා වේ. ඒ අනුව අපි පළමුව ම දාන විපාක දක්වන්නෙමු.

(අං.නි. පඤ්චක නිපාතයෙහි සීහසේනාපති සූත්‍රය)

### දානයේ ආනිසංස

සාන්දෘෂ්ටික (මෙලොවම තමා විසින් දැක ගත හැකි) දානානිසංස සතරක් පෙන්වා ඇත.

- දායක තෙමේ බොහෝ දෙනාට ප්‍රියමනාප කෙනෙක් වේ.
- දායකතුමා පිළිබඳව යහපත් කීර්ති රාවයන් පැතිරේ
- ඕනෑම පිරිසක් කරා විශාරදව එළඹීමේ ශක්තියක් ලැබේ. මකුවීමකට තෙද රහිත වීමකට පත් නොවේ
- යහපත් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබේ.

### එසේම දානනිසංස සූත්‍රයට අනුව

- ගිහි ධර්මයන්ගෙන් නො පිරිහුන කෙනෙක් වන බව දක්වා ඇත. අඛණ්ඩව සිල් ආදී ගුණ පන්සිල් ආදි ගුණ රකින්නෙකු යන අර්ථයයි
- තව ද මරනින් මතු සුගති ලෝකයක ඉපදීමට ද මෙම දානමය පිංකම හේතුවන බව පෙන්වා දී ඇත.

Scanned by CamScanner

පින්වතුනි, තව ද සත්පුරුෂ දාන පහක් ඇති අතර එහි විශේෂ විපාක සප්පුරිස දාන සූත්‍රයට අනුව මෙසේය

**සත්පුරුෂ දාන ආනිසංස පහ**

- ශ්‍රද්ධාවෙන් දන්දීම හේතුවෙන් විශිෂ්ඨ රූප සම්පත් ලැබේ. එබැවින් ශ්‍රද්ධාවෙන් ම දන් දෙත්වා
- සකස් කොට දන්දීම හේතුවෙන් කීකරු දූ පුතුන් අඹුදරුවරුවන් ස්වාමිපුත්‍රයන් දැසි දස්සන් ලැබේ. (එබැවින් දෙන දෑ සකස් කොට දීමට පුරුදු වන්න)
- ආගන්තුක දාන, ගමික දාන, දුර්භික්ෂ දාන ආදි සුදුසු කල්හි දන් දීම හේතුවෙන් තරුණ වයසේ දී බොහෝ සැප සම්පත් ලැබේ.
- ලෝභයකින් තොරව දන්දීම හේතුවෙන් හොඳ ආහාරපාන, යාන වාහන, ගේදොර ආදිය පරිභෝජනය කිරීමට සිත් නැමෙනු ඇත. ලැබෙන දෑ පරිභෝග කිරීමට සිත නැමෙනුයේ ලෝභයෙන් තොරව දන්දීම හේතුවෙනි.
- තමා ද අන් අය ද වෙහෙසට පත් නො කොට ධාර්මික වස්තුවෙන් දන්දීම හේතුවෙන් මතු ලැබෙන සම්පත් ගින්නෙන්, ජලයෙන්, සොර සතුරන්ගෙන්, අකීකරු දූ දරුවන්ගෙන් විනාශ වී තමාට අහිමි නො වේ. ලැබෙන සම්පත් සුරක්ෂිත වේ කියා ය.

**සත්පුරුෂ පින්වතුනි, තවත් දාන හතරක ආනිසංස ධර්මයෙහි සඳහන් වේ.**

- තමා ගේ ධනයෙන් දන්දෙන අතර අන්‍යයන් ඊට සහභාගී කර නො ගනී. ඒ හේතුවෙන් ඒ අයට මතු භෝග සම්පත් ලැබෙන අතර පරිවාර සම්පත් නො ලැබී යයි.
- තම ධනය වියදම් නො කොට බොහෝ පිරිස් එකතු කොට ඒ අයගේ ධනයෙන් දන්දීම හේතුවෙන් මතු ධන සම්පත් නො ලැබෙන අතර පරිවර සම්පත් ලැබෙනු ඇත.
- තමා ද දන් දෙන අතර දෙන දානයකට ද සහභාගී නො වීම හේතුවෙන් මතු ධන සම්පත් ද පිරිවර සම්පත් ද යන දෙකම නො ලැබේ.
- තම ධනය ද යොදා අන් අය ද ඊට සහභාගී කරගෙන දෙන දානය හේතුවෙන් මතු ධන සම්පත් ද පිරිවර සම්පත් ද යන දෙකම ලැබෙනු ඇත.

ශ්‍රද්ධාව අවදි කරගෙන නුවණින් යුක්තව එකඟ වූ නො විසිරුන සිතින් දෙන පුංචි දෙයක් වුව ද මහත් ඵල වන බව පෙන්වීමට අපදාන පාලියට අනුව කරුණු පෙන්වා දෙමි.

(ධම්ම පදට්ඨ කථා 46 පිටුව)

**මල් පූජාවේ ආනිසංස**

පදුම හිමි පෙර ජිවිතයකදී පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට එක් පියුමක් ගෙන පූජා කළ පිනෙන් මල්පෙති ගණනට සක්විති රජව ඉපදුනා. හත්සිය වතාවක් පාථුවි රාජ්‍ය කලා. අවසානයේ නිවන් සුව ලැබීමට ඒ පින හේතු වු බව පෙන්වා ඇත. (අපදාන පාලි බු·ව:193 පිට)

Scanned by CamScanner

**නීලුප්පලමාලිය හිමි** විපස්සී බුදුරජුට උපුල් මල් තුනක් පුදා කල්ප අනූ එකක් දුගතියකට නො යන ලදී. මේ පිනෙන් තුන්සිය වතාවක් සක් දෙව් රජ ව ඉපදුනා. පන්සිය වතාවක් සක්විති රජ වුණා. අවසානයේ නිවන් දැකීමට ද මේ පින උපනිශ්‍රය වුණා. බලන්න සත්පුරුෂයෙනි, හැඳුනු සිතකින් පින්කම් කිරීමේ අගය.

(අපදාන පාලි බු:ව:324 පිට)

සත්තුප්පල මාලකා තෙරණිය පෙර ජීවිතයක සිඛී බුදුරජාණන් වහන්සේට මානෙල් මල් සතක් එකළු සිහින් නුවණ යොදා පිදූ පිනෙන් වාර හැත්තෑ හතක් දෙදෙව් ලොවට අධිපති සක් දෙවිඳු ගේ බිරිඳ වී උපන්නා ය. ඒ මලේ පාට හා සුවඳ ඇයට හැම දිවියකදී ම ලැබෙණු අතර අවසානයේ නිවනට ද මේ උතුම් පින උපනිශ්‍රය විය.

(ථේරී අපදානය 8)

**තිකණ්ණිකාර පුප්ඵිය හිමි** සුමේධ බුදු රජාණන් වහන්සේට කිණිහිරියා මල් තුනක් පැහැදුන සිහින් නුවණ යොදා පූජා කල පිනෙන් තුන්සිය වතාවක් සක්විති රජවිය. පන්සිය වතාවක් සක් දෙව් තනතුර ද හැම ජීවිතයකදී ම පහත සඳහන් විපාක ද ලැබුණා හ.

- මහත් භෝග සම්පත් ඇත්තෙකු වුණා.
- පහත් කුලවල නො ඉපද උසස් කුලවල ම ඉපදුනා
- කැමති කැමති යාන, වාහන ලැබුණා
- බොහෝ රූමත් ස්ත්‍රීන් හා දැසි දස්සන් ලැබුණා
- බොහෝ අගනා වස්ත්‍රාභරණයන්ට ලාභී වුණා
- සෑම කල් හි අන් අය ගේ ගෞරවයට පාත්‍ර වුණා
- උසස් කීර්තියක් ඇත්තක් වුණා
- සෑම කල් හි බොහෝ පිරිවර ජනයා ඇත්තෙක් වුණා
- තම පිරිස කිසිවෙකුට භේද කළ නො හැකි වුණා
- ඥාතීන් අතර උසස් (උතුම්) ශ්‍රේෂ්ඨයෙකු වුණා
- ශීත උෂ්ණ වලින් පීඩාවක් නො වුණි
- කායික හා මානසික දාහ නැති උතුමෙක් වුණා

අවසානයේ නිවන් සුව අවබෝධයට ද ඒ උතුම් පින උපනිශ්‍රය වුණා.

(අපදාන පාලි 501 වන අපදානය)

**පහන් පූජාවේ ආනිසංස**

අජිත ස්වාමීන් වහන්සේ පියුමතුරා බුදු රජුන්ට එක් මීතෙල් පහනක් පිදූ පිනින් කල්ප හැටදාහක් දෙව්ලොව සැප විඳ දහස් වතාවක් සක්විති රජව උපන්නේ ය. සතිස් වතාවක් සක් දෙව් වුණා. වාර සත් සියයක් ප්‍රදේශ රජ වුණා. අවසානයේ නිවන් දැකීමට ද ඒ කුසලය ම උපනිශ්‍රය වූ බව දැක්වේ.

(අපදාන පාලි 400 වන අපදානය)

**එකදීපිකා තෙරණින්** වහන්සේ පෙර බුදු සසුනක කළුවර රැයක බෝධීන් වහන්සේට පහන් පහක් පිදූ පිනෙන් අසූ වාරයක් දෙව්ලොවට අධිපති සක් දෙවිඳු

Scanned by CamScanner

ගේ බිරිඳ වී උපන්නා ය. දහස් ගණන් සක්විති රජ දරුවන්ට අග මෙහෙසිය වුණා ය. අප බුදුසසුනෙහි, සත් අවුරුදු වියෙහි, ගිහන් දැකීමටද ඒ පින උපනිශ්‍රය වී ඇත.

(9 වන ථේරී අපදානය)

**සකුලා තෙරණිය** කාශ්‍යප බුදුරජුන් පිරිනිවීමෙන් පසු උන්වහන්සේ ගේ චෛත්‍යයට එක් රැයක් එක් පහනක් පුදා පහත සඳහන් ආනිසංස ලැබුණු බව ථේරී අපදානේ දක්වා ඇත්තේ ය.

- සෑම තැනම තමාට ප්‍රදීප දැල් වේ
- දිවැස් ලැබේ
- තීක්ෂණ නුවණ ලැබේ
- යසසින් දිලියෙත්
- ශ්‍රද්ධාව හා ප්‍රඥාව මනාව පිහිටත්
- උසස් කුල සම්පත් ඇත්තෙකු වේ.

**එකදීපිය හිමි** සිද්ධාර්ථ බුදුරජුන් ගේ චිතකයට එක් පහනක් පුදා එක් තිස් වරක් සක් දෙව්දු විය. විසි අට වතාවක් සක්විති රජ බව ද ලැබුවා. තව විශේෂ අනුසස් දෙකක් ද ලැබුවා.

- විෂම ස්ථාන වලට යන විට සමවෙන්නා ග
- විහිවිද පෙනෙන දෙනෙත් ඇත්තෙකු විය.

(416 වන ථේරී අපදානය)

පින්වතුනි, පහන් පුවාසු දහසක් විසිරුණ කැලඹුන සිතින් පිදුවත් මෙපමණ අනුසස් ගෙන නො දෙන අතර, පැහැදුන සිතින් එකග සිතින් බුද්ධිමත්ව එක පහනක් පිදුවත් මහත් අනුසස් ලැබෙන බව වටහා ගනිත්වා.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**

Scanned by CamScanner